# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1929/10 - 2015 අගෝස්තු මස 24 වැනි සඳුදා - 2015.08.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 94/47(v)

**(269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනත**

6(2)(ආ) සහ 21(2)(ආ) වගන්ති යටතේ වූ නියමය

(269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනතේ 6(2)(ආ) වගන්තිය සහ 21(2)(ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ සහ සංස්කෘතික කටයුතු අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මා විසින්, මේ නියමය මගින්

(අ) ඉහත කී ආඥාපනතේ කාර්ය සඳහා මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වෙන ඉඩම් ප්‍රදේශය නාගරික සංවර්ධන ප්‍රදේශයක් බවටත් එය ''ගල්පිහිල්ල රජමහා විහාර පූජා භූමිය'' යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු බවටත් ප්‍රකාශයට පත් කරනු ලැබේ ; සහ

(ආ) ''ගල්පිහිල්ල රජමහා විහාර පූජා භූමිය'' වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබූ සම්පූර්ණ ප්‍රදේශය සම්බන්ධයෙන් දළ සැලසුම් යෝජනා ක්‍රමයක් සකස් කළ යුතු බවටත් විධාන කරනු ලැබේ.

රනිල් වික්‍රමසිංහ,
ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු,
ළමා, තරුණ සහ සංස්කෘතික කටයුතු අමාත්‍ය.

2015 ජූලි මස 17 වැනි දින,
කොළඹ 01,
ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු,
ළමා, තරුණ සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ දී ය.

1A - G 21955—08 (2015/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

***''ගල්පිහිල්ල රජමහා විහාර පූජා භූමිය'' සංයුක්ත වන ප්‍රදේශය***

බලයලත් මිනින්දෝරු ඊ. එම්. පී. ඩබ්. වයි. වේරපිටිය මහතාගේ 2014 ජූනි මස 16 වැනි දින දරන අංක 14/116 දරන සැලැස්මේ කැබලි අංක 1, 2 සහ 3 ලෙස දක්වා ඇති මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පාතදුම්බර උඩගම්පහ කෝරළයේ, හුරිකඩුව ග්‍රාමයේ පිහිටි ප්‍රමාණයෙන් හෙක්ටයාර් 2.6173 විශාලත්වයෙන් යුක්ත පහත දැක්වෙන පරිදි මායිම් වූ බිම් ප්‍රදේශය :-

**කැබලි අංක 1**

| | | |
|---|---|---|
| උතුරට | : | පිහිල්ල කුඹුර ; |
| නැගෙනහිරට | : | පිහිල්ල කුඹුර ; |
| දකුණට | : | පිහිල්ල කුඹුර ; |
| බටහිරට | : | පිහිල්ල කුඹුර. |

**කැබලි අංක 2**

| | | |
|---|---|---|
| උතුරට | : | ඇළ හා ප්‍රාදේශීය සභා මාර්ගය ; |
| නැගෙනහිරට | : | ප්‍රාදේශීය සභා මාර්ගය ; |
| දකුණට | : | ප්‍රාදේශීය සභා මාර්ගය හා ඇළ ; |
| බටහිරට | : | ඇළ. |

**කැබලි අංක 3**

| | | |
|---|---|---|
| උතුරට | : | එකනෙක්ගෙදර කුඹුර ; |
| නැගෙනහිරට | : | එකනෙක්ගෙදර කුඹුර ; |
| දකුණට | : | පිහිල්ල කුඹුර ; |
| බටහිරට | : | පිහිල්ල කුඹුර. |

09-148

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.